**කොළඹ විශ්වවිද්‍යාලය - 2023**

------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

කොළඹ විශ්වවිද්‍යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන

වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1994 අප්‍රේල් 20 දිනැති අංක 30/94 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය හා 2019 ජූලි 25 දිනැති අංක SC&PMU/Grant/19 දරන විදේශ සම්පත් දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය | විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අනුදැනුම හා එකඟතාවය ලබාගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී රු.339,691,267ක් වූ විදේශ ප්‍රදාන සෘජුව විශ්වවිද්‍යාලය වෙත ලබා ගැනීමට කටයුතු කර තිබුණි. | මෙම මුදල් ප්‍රදානයන් නොවන අතර විශ්ව විද්‍යාලයේ ව්‍යාපෘති/පර්යේෂණ සඳහා ලැබුණු මුදල් බව. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2020 ඔක්තෝබර් 26 දිනැති අංක 02/2020 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයෙහි 02(v) වන ඡේදය | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් තනතුරු වලට ලබා දී තිබුණු වැටුප් කේතවල වැටුප් ප්‍රමාණයන් ඉක්මවා 2020 සිට 2023 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය තුළදී අනුමත තනතුරු 02 ක නිලධාරීන් 03 දෙනෙකුට විශ්වවිද්‍යාලය විසින් තීරණය කරන ලද වැටුප් ලෙස රු.19,577,232ක් වැඩිපුර ගෙවා තිබුණි. | සේවයේ අවශ්‍යතාවයට හා වෙළෙඳපොළ වටිනාකමට අනුව ඉහළ වැටුප් ලබා දීමට සිදු වූ බව. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ v වැනි පරිච්ඡේදයේ 7 ඡේදය | බැඳුම්කර ගිවිසුම් කඩකළ ආචාර්යවරුන් 35 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.159,907,138ක් වර්ෂ 01 සිට වර්ෂ 34 දක්වා කාලපරිච්ඡේදයක් ගත වී තිබුණ ද අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | මේ පිළිබඳව අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | බැඳුම්කර ගිවිසුම් කඩකළ අචාර්යවරුන් ගෙන්අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2023 ජනවාරි 18 දිනැති අංක BD/HRD/126/214/19/2023 දරන භාණ්ඩාගාර ලේකම් විසින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් ඇමතූ චක්‍රලේඛ ලිපියේ 5 වන ඡේදය | බැඳුම්කර කඩකරන ලද ආචාර්යවරුන්ගෙන් සමාලෝචිත වර්ෂය තුළ දී අයකරගෙන තිබුණු රු. 135,987,614 ක් රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම අරමුදල් අවසර ලත් අරමුණු සඳහා සුදුසු පරිදි භාවිතා කර ඇති බැවින් භාණ්ඩාගාරයට මාරු නොකළ බව. | භාණ්ඩාගාර උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 977,902,106ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.3,330,270,379ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,352,368,273ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට රජයේ ප්‍රාග්ධන ප්‍රදාන අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නිත්‍යානුකූල අනුමැතියකින් තොරව විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ කාර්යමණ්ඩලය යොදවාගෙන ඇපයෙන් සීමිත සමාගමක් 2013 වර්ෂයේදී පිහිටුවා තිබුණු අතර ඉන් වසර 5 කට පසු විශ්වවිද්‍යාලය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබුණි. එම ගිවිසුම අනුව සමාගමේ විගණිත මූල්‍ය ප්‍රකාශන වාර්ෂිකව විශ්වවිද්‍යාලයේ පාලක සභාව වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් සමාගමේ එකදු මූල්‍ය ප්‍රකාශනයක්වත් පාලක සභාවට ඉදිරිපත් කර නොතිබුණි. එමෙන්ම, සමාගම උපයන ආදායමින් විශ්වවිද්‍යාලයට ලබාදිය යුතු දායකත්වය පිළිබඳ අවබෝධතා ගිවිසුමෙහි සඳහන් කර නොතිබීම හේතුවෙන් ඉකුත් වර්ෂ 9ක කාලපරිච්ඡේදය තුළ රු.1,885,690ක් පමණක් ලබා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දී කිසිදු පුරස්කාර ආදායමක් විශ්වවිද්‍යාලයට ලබා දී නොතිබුණි. තවද, විශ්වවිද්‍යාලයේ බුද්ධිමය දේපල ප්‍රතිපත්තිය අනුව සමාගමේ නව නිපැයුම්, පේටන්ට් ඇතුළු බුද්ධිමය දේපල විශ්වවිද්‍යාලයේ බුද්ධිමය දේපල කළඹ තුළට ඇතුළත් කර ඒවායේ ආරක්ෂාව තහවුරු කර ගැනීමේ ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. | පුරස්කාර ආදායම් වෙනත් ආදායම් තුළ ඇතුළත් කර ඇති බව. | ගිවිසුම අනුව සමාගමේ විගණිත මූල්‍ය ප්‍රකාශන වාර්ෂිකව විශ්වවිද්‍යාලයේ පාලක සභාව වෙත ඉදිරිපත් කළ යුතු අතර විශ්වවිද්‍යාලය වෙත ආදායම් අයකර ගැනීමට හා බුද්ධිමය දේපල ආරක්ෂා කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ අධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා ලබා දී තිබුණු රු.8,194,808ක් වූ පර්යේෂණ 13ක් අවසන් කිරීමට නියමිත දින ඉක්මවා අවුරුදු 1 සිට අවුරුදු 4 දක්වා කාලයක් ගත වී තිබුණ ද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණි. තවද, 2018 සිට 2020 කාලපරිච්ඡේදය තුළ දී වටිනාකම රු.8,821,000ක් වූ පර්යේෂණ 17 ක් විවිධ හේතු මත අතහැර දැමීම හා අවලංගු කිරීම් සිදු කර තිබුණි. | අනුමත කරන ලද ප්‍රතිපාදන වෙනත් පර්යේෂණ කාර්යයන් සඳහා යෙදවීමට කටයුතු කරනු ඇති බව. | අනුමත කරන ලද පර්යේෂණ නියමිත කාලසීමාව තුළ නිමකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වටිනාකම රු.25,518,200,000 ක් වූ ඉඩම් 8ක හා තක්සේරු කර නොතිබුණු ඉඩම් 4ක නීත්‍යානුකූල හිමිකම සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පවරා ගෙන නොතිබුණි. | ඉඩම් වල අයිතිය තහවුරු කිරීම පිණිස අවශ්‍ය ක්‍රියාමාර්ග දිගින් දිගටම විශ්වවිද්‍යාල පාර්ශවයෙන් සිදු කර ඇති අතර ප්‍රමාදයන් පවතින්නේ අනෙකුත් රාජ්‍ය ආයතන වන ප්‍රාදේශීය ලේකම් කාර්යාල ආදියෙන් බව. | ඉඩම්වල නීත්‍යානුකූල හිමිකම පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.2 අරමුදල් ඌන උපයෝජනය**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| එකතුව රු.117,946,258ක් වූ අරමුදල් (Designated Funds) 44 ක් සමාලෝචිත වර්ෂය තුළදී අදාළ අරමුණුගත කාර්යයන් වෙනුවෙන් උපයෝජනය කර නොතිබුණි. | 2023 වර්ෂයේදී පුනරාවර්තන වියදම් සඳහා රු. මිලියන 441 ක් හා ප්‍රාග්ධන (Capital) වියදම් සඳහා රු මිලියන 392 ක් වියදම් කර ඇති බව. | අදාළ අරමුදල් අරමුණුගත කාර්යයන් වෙනුවෙන් ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුය. |